# සඳුනිට පුළුවන්



දිනනි සෙනෙවිරත්න

# සඳුනිට පුළුවන්

දිනනි සෙනෙවිරත්න

# සඳුනිට පුළුවන්

**ප්‍රථම මුද්‍රණය :-** 2023 දෙසැම්බර්

© කර්තෘ ප්‍රකාශනයකි

ISBN 978-624-208-112-0

**කර්තෘ, පිටකවරය සහ චිත්‍ර නිර්මාණය :**



දිනති අදායා හිමසරණි සෙනෙවිරත්න
150/6, ක්‍රිස්ටෝපර් පාර,
පේරාදෙණිය
මහාමායා බාලිකා විද්‍යාලය, මහනුවර

**මුද්‍රණය :** නෙත්වින් ප්‍රින්ටර්ස්
නො. 832, ''දළඳා සෙවනේ අපි පදනම''
ගැටඹේ හන්දිය,
මහනුවර
081 2 386 908

# පිදුම

“මගේ දුව හරි දක්ෂයි!
මට ඔයාව විශ්වාසයි. ඔයා ඉහළටම යනවා,
දවසක මේ විශ්වයම ජය ගන්නවා!! ”...
මේ විදියට මාව දිරිමත් කල,
මගේ හිතේ හැමදාම ජීවත් වෙන
අපූරු ගුරුතුමිය, “සමන්මලී” (සමන්මලී මැඩම්)
වෙනුවෙන්...

- දිනනි -

# පෙරවදන

වත්තමන් අධ්‍යාපනයෙන් ඵලදායී පුරවැසියෙකු සතුටින් ජීවත් වන පවුලක් මෙන්ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාවයි. එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත් කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුමකරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමු කිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශිය සාහිත්‍යය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණය කරමින් ''දිවිය දිනන විද්‍යුත් පොතක්'' ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකු වීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේ ම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගය කරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමී ව අප පාසල විසින් සංවිධානය කළ ''දිවිය දිනන විද්‍යුත් පොතක්'' ව්‍යාපෘතියට එක් වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුනු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවා'යි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කළමනාකරණ මණ්ඩලය ගුරු භවතුන් දෙමාපියන් ආදී ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමු කළ විදුහල්පතිවරුන් ගුරු භවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තූතිය මෙමඟින් පිරිනමමි.

ශශිකලා සේනාධීර
විදුහල්පතිනිය,
මහාමායා බාලිකා විද්‍යාලය, මහනුවර

# හැඳින්වීම

මේ පොත ලිව්වේ හතර වසරෙදි,

මගේ ආදරණීය  සමන්මලී ගුරුතුමිය නිසා....

ඈ තමයි මට කියාදුන්නෙ ගුරුවරුන්ගෙ ආදරේට, සොයා බැලීම්වලට

දරුවන්ගෙ ජීවිතවලට හරි ම සතුටු දේවල් දෙන්න පුළුවන් කියලා.

හතර ශ්‍රේණිය පුරා ම අපට ඉගෙනගන්න ලැබුණු ප්‍රායෝගික අත්දැකීම් නිසා

අද වෙද්දි හුඟාක් සතුටු දේවල් අපට ලැබෙනවා කියලා දැනෙනවා.

එදා මම

ලියන්න කම්මැලි නිසා අදහසක් හිතට ආවේ නැහැ. හැබැයි මට ගණිතය අමාරුයි. ඒ ගැන  ලිව්වොත් හොඳයි කියලා හිතුණා. ඒ විදියට  තමයි මේ පොත මම ලියන්න පටන් ගත්තේ. මට හිතෙනවා මේ පොතේ ලියූ දේවල් අදටත් වටිනවා කියලා.

මම වගේ අමාරුවෙන් විෂයන් ඉගෙනගන්න අය තව ගොඩක් ඉන්නවා.ඒ අයට මට  දෙන්න තියෙන පණිවිඩය නම් " අමාරුයි කියලා කිසි දෙයක් අත හරින්න එපා" කියන එක.අපිට  බැරි නැහැ.

උත්සාහයයි , කැපවීමයි තියෙනවානම් අපට මේ විශ්වයෙන් එහා, ඈතින් ඈතට... දුර ගමනක් යන්න  පුලුවන්.

''දිනනි''

# සඳුනිට පුළුවන්

ඔන්න එකෝමත් එක ගමක සඳුනි කියලා පුංචි ගැහැනු ළමයෙක් හිටියා. එයා ගොඩක් දුකින් හිටියේ. මොකද දන්නවද? එයාට ගණිතය බෑ.

එයාට යාළුවෝ විහිළු කළා. දැන් විභාගය ටිකෙන් ටික ළඟයි. පළමු දවසේ ගණිතය, එයා ඒකට ගොඩක් උත්සාහ කළා. ඔන්න ලකුණු දෙන දවස ආවා. එයාට ගණිතයට ලකුණු 20 යි. එයාට ගොඩක් දුක හිතුණා. ඒ වුණාට අනික් විෂයන්ට සීයෙන් සීය හම්බ වුණා.





අනික් විෂයන් වලට ලකුණු වැඩි නිසා එයාට ගොඩක් සතුටු හිතුණා.

අම්මටයි, තාත්තටයි ගොඩාක් සතුටු හිතුණා. සඳුනි තමයි පංතියේ දෙවැනියා. අම්මා එයාට තෑග්ගත් අරන් දුන්නා.



ඒ වුණාට සඳුනිට එක දෙයක් ගැන දුකයි. ඒ ගණිතය බැරි නිසා. හැමවෙලාවෙම එයාට හිතුනේ ''මට ගණිතය බැහැ'' කියලමයි. සඳුනිට යාළුවෙක් හිටියා පියුමි කියලා. පියුමි හැමවෙලාවෙම කිව්වේ ''සඳුනි දක්ෂයි. සඳුනිට පුලුවන්'' කියලාමයි. එයා සඳුනිට උදව් කරා. ඊට පස්සේ සඳුනිගේ හොඳම යෙහෙළිය වුණේ පියුමි.

පියුමි උදව් කළ නිසා දැන් සඳුනිට ගණිතය ටිකක් පුළුවන්. දැන් දෙවන වාරය පටන් ගත්තා. එයාට ගණිතයට 50 යි. ''ඒ වුණාට කමක් නෑ. ඔයාට පස්සේ කාලෙක ගණිතය පුළුවන් වෙයි.'' ගුරුතුමී කිව්වා.

එයා ගණිතයට මහන්සි වුණා. ගුරුතුමී සඳුනිට උදව් කළා. ගණිතය ගැන එයාට කැමති හිතුණා.





තුන් වෙනි වාරයේ ගණිතයට ලැබුණු ලකුණු ගැන එයාට ගොඩාක් සතුටු හිතුණා. එයාට ගණිතයට සීයයි. එයා පංතියේ පළමු වෙනියා. අම්මටයි, තාත්තටයි ගොඩක් සතුටුයි.

මේ සැරේ තාත්තත් තෑග්ගක් අරන් දුන්නා, ගුරුතුමිත් තෑග්ගක් අරන් දුන්නා. පියුමිත් තෑග්ගක් අරන් දුන්නා. අම්මත් තෑග්ගක් අරන් දුන්නා. එයාට ගොඩක් සතුටු හිතුණා. දැන් තෑගි ගොඩයි.



සඳුනි දැන් හරි දක්ෂයි. යාළුවෝ එයාට කිව්වා ''ඔයා අපේ පංතියට ආඩම්බරයක්'' කියලා.

කාලය ගතවුණා. පුංචි සඳුනි ලොකු වුණා.



ඔයාලා දන්නවද ඊට පස්සේ සඳුනිට මොකද වුණේ කියලා? එයා දක්ෂ විද්‍යාඥවරියක් වුණා.

එයාගේ හොඳම යෙහෙළිය පියුමිත් වෛද්‍යවරියක් වුණා. එයාලා හොඳම මිතුරියෝ වගේ හැමදාම හිටියා.

ඉතිං පුංචි යාලුවනේ,

උත්සාහ කළොත් බැරි දෙයක් නැහැ.
හරියට සඳුනි වගේ.

දන්න දෙය කියලා දීලා, අනිත් අයට උදවු කළොත්
අපිට තවත් හොඳ දක්ෂයෝ
වෙන්න පුළුවන්.
හරියට පියුමි වගේ.

# ස්තූතියි



# පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමඟ සිදුවන සමාජ, ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇති කිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇති කිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යාංශය පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමු කරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වා දෙන ලදී. ඒ යටතේ වැඩි ම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන් ය.

පාසල තුල ගොඩනැගී ඇති ලේඛණ සංස්කෘතිය නව මාවතකට යොමු කරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය. ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබා දෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල් වන අතර ම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනය කරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්ටමින් ආරම්භ කර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමඟ එක්ව විද්‍යුත් කෘතියක් රචනා කර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවා'යි පතමු...

මෙයට,

සෙනෙවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමු කළ ව්‍යාපෘතියේ නිර්මාපක

ISBN 978-624-208-112-0

9 786242 081120